# ප්‍රධාන කරුණු ලේඛනය– KFD)
# ඔටෝ ලෝන් ණය පහසුකම
**ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව සහ ෆිනෑන්ස් PLC**

## 1. ඔටෝ ලෝන් ණය පහසුකම- වාහන ණය (Auto Loan)

මෙම නිෂ්පාදනයේ අරමුණ වන්නේ වාහනයක් (උදාහරණයක් ලෙස ම ටර් කාර්යක් හ ද්වීකාර්ය වාහනයක්) මිලදී ගැනීම සඳහා, එම වාහනය ඇපකරයක් ලෙස පවත්වා ගනිමින්, ගනුදෙනුකරුවන්ට ආර්ථික සහය ලබා දීමයි.

## 2. ප්‍රධාන ලක්ෂණ සහ ප්‍රතිලාභ

- ආකර්ෂණීය පොලී අනුපාත
- අවම ණය නිකුත් කිරීමේ කාලය
- වසර 5 කට දක්වා ආපසු ගෙවීමේ කාලසීමාව
- කඩිනම් පාරිභ ගික සේවාව

## 3. සුදුසුකම් (Eligibility)

**අයදුම්කරු පහත අවශ්‍යතා සපුරාලිය යුතුය:**

A) වයස අවුරුදු 18ට වැඩි සහ 65ට අඩු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය

B) පිළිගත හැකි / සනාථ කළ ආපසු ගෙවීමේ හැකියාවක් තිබිය යුතුය

C) පැහැදිලි සහ සතුටුදායක ණය වාර්තාවක් (CRIB) තිබිය යුතුය

D) ණය පහසුකමේ අරමුණ වාහනයක් (ම ටර් රථ / ද්විත්ව කාර්ය වාහනයක්) මිලදී ගැනීම සහ ණය පහසුකමේ අරමුණ නීතිමය විය යුතුය

## 4. පොලී අනුපාත සහ අනෙකුත් ගාස්තු

**4.1** පොලී අනුපාත

පොලී අනුපාත, වත්කම්වල ගුණාත්මකභාවය, පාරිභ ගික අවදානම් පැතිකඩ සහ වෙළඳපොළ තත්ත්වයන් සලකා ALCO කමිටුව විසින් ගනු ලබන තීරණ මත පදනම් වේ.

අවම පොලී අනුපාතය වාර්ෂිකව 16.00% සිට ක්‍රියාත්මක වේ.

4.2 අනෙකුත් ගාස්තු

4.2.1 ලේඛන ගාස්තු

| | |
|---|---|
| LKR 499,000 දක්වා | රු. 7,500.00 |
| LKR 500,000 - LKR 999,999 | රු. 10,000.00 |
| LKR 1,000,000 - LKR 1,999,999 | රු. 12,000.00 |
| LKR 2,000,000 - LKR 2,999,999 | රු 14,000.00 |
| LKR 3,000,000 - LKR 4,999,999 | රු. 17,500.00 |
| LKR 5,000,000 - LKR 9,999,999 | රු. 20,000.00 |
| LKR 10,000,000 ඉක්මවන | අවම 25,000.00 |

4.2.2 **ගාස්තු – චංචල දේපළ මත ලබාදෙන ණය පහසුකම්**

රජය විසින් අනුමත කරන ලද RMV / DMT වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු අදාළ වේ..

4.2.3 **මාසික වාරික නොගෙවීම / ප්‍රමාද වී ගෙවීම වෙනුවෙන් අය කරනු ලබන දණ්ඩන පොලිය (ඇත්නම්)**

නියමිත දිනට වාරික මුදල් නොගෙවන අවස්ථාවලදී, එම ප්‍රමාද වූ කාලසීමාව සඳහා මසකට **සියයට තුනක (3%)** අමතර පොලියක් (Overdue interest) අය කරනු ලැබේ.

**4.2.4 පහසුකම කල් පිරීමට පෙර පියවීම:**

ණය ගැණුම්කරු විසින් (නියමිත කාලයට පෙර) කලින් ණය පියවා දමනු ලබන අවස්ථාවක දී, එම පහසුකමේ ඉදිරි පොලිය සඳහා සහනයක් ලබා දීම සම්පූර්ණයෙන්ම MBSL ආයතනයේ තනි අභිමතය පරිදි සිදු වේ.

**4.2.5 අදාළ වන අනෙකුත් ගාස්තු**

| අංකය | ගාස්තු / අයකිරීම් පිළිබඳ විස්තරය | ගාස්තු / අයකිරීම් (ශ්‍රී.ල.රු.) |
|---|---|---|
| 1 | ගිණුම් ශේෂ තහවුරු කිරීම් | 1,000.00 |
| 2 | හිඟ මුදල් නොමැති බවට වන ලිපි | 250.00 |
| 3 | පාරිභ ගික ණය පියවීමේ ඉතිහාසය | 250.00 |
| 4 | සියලුම වාහන වර්ග සඳහා වන (Duplicate Deletion) ණය අවලංගු කිරීමේ ලිපි පිටපත් | 2,000.00 |
| 5 | **විරුද්ධත්වයක් නොමැති බවට වන ලිපි** | 1,000.00 |
| 6 | ණය ශේෂය තහවුරු කිරීමේ ලිපි | 1,000.00 |
| 7 | **ණය පියවීමේ ලිපි** | 750.00 |
| 8 | **ණය දෙන්නන් / මිලදී ගන්නන් වෙත නිකුත් කරන ඉන්වොයිසි** | 1,500.00 |
| 9 | **අගරු වූ චෙක්පත් සඳහා වන ගාස්තු** | 2,500.00 |
| 10 | **අණකරු විසින් ගෙවීම් අත්හිටුවන ලද අගරු වූ චෙක්පත්** | 5,000.00 |

## 5. ලබාදිය හැකි වාහන වර්ග, ණය සීමාව සහ ලබාගත යුතු ආරක්ෂණ

a) චංචල දේපළ – වත්කම්

භ්‍යාන්තර අගය කරණ නිලධාරීවරයා (SM CCD) විසින් නිර්ණය කළ වෙළඳපොළ අගයේ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිකුත් කරන ලද උපදෙස් සහ Loan to Value (LTV) අනුපාත මත පදනම් ව

b) ම ටර් රථ සහ ද්විත්ව කාර්ය වාහන (Dual Purpose Vehicles) වැනි ප්‍රසිද්ධ වාහන සඳහා.

## 6. අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ

- සියලුම විභවතාව සහිත පාරිභ ගිකයින් වෙත ආසන්නතම ශාඛාවට ආරාධනා කර ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳ සාකච්ඡා කරනු ලැබේ.
- සාකච්ඡාවෙන් පසු, ශාඛාව පාරිභ ගිකයාගේ අවශ්‍යතාව අනුව ඇගයීම සිදු කර ක්‍රියාවලිය ආරම්භ කරනු ලැබේ.
- අනුමත DOA අනුව අනුමැතිය ලබා ගනු ලැබේ.

**6.1 අවශ්‍ය ලේඛන**

**6.1.1 තනි පාරිභ ගිකයින් සඳහා**

i. නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම් පත්‍රය
ii. ජාතික හැඳුනුම්පත් පිටපත
iii. වලංගු බිල් ඔප්පු (මාස 06 ක කාලය තුළ)
iv. ආදායම් ප්‍රකාශ (වැටුප් තහවුරු කිරීමේ ලිපිය / මෑත වැටුප් තොරතුරු / බැංකු ප්‍රකාශ) / මුදල් ප්‍රවාහ ප්‍රකාශ
v. CRIB වාර්තාව (පෞද්ගලික සහ ව්‍යාපාරික, ඇත්නම්)
vi. අවසන් මාස 6 ක බැංකු ප්‍රකාශ (පෞද්ගලික සහ ව්‍යාපාරික)

vii. BR පිටපත (ලබා ගත හැකි නම්)
viii. අනෙකුත් ආදායම් සාක්ෂි ලේඛන

**6.1.2 සීමිත වගකීම් සහිත සමාගම් / ලැයිස්තුගත සමාගම්**

i. සංස්ථාගත කිරීමේ සහතිකය
ii. සංගම් ව්‍යවස්ථාව
iii. 1 ආකෘති පත්‍රය, නවතම 13 ආකෘති පත්‍රය, 15 ආකෘති පත්‍රය, 20 ආකෘති පත්‍රය සහ බදු ගෙවීමේ රිසිට්පත් ආදායම් බදු (නවතම) පිටපත්
iv. බදු ගෙවීමේ රිසිට්පත් / ආදායම් බදු (ආසන්නතම)
v. අධ්‍යක්ෂ මණ්ඩල ය ජනා සම්මතයන්
vi. අවසාන වසර තුනේ විගණනය කරන ලද ගිණුම්
vii. වත්මන් වර්ෂයේ කළමනාකරණ ගිණුම් / මුදල් ප්‍රවාහ ප්‍රකාශන
viii. අවසාන මාස 6 ක බැංකු ප්‍රකාශන
ix. ණය තොරතුරු කාර්යාංශ (CRIB) වාර්තාව (ව්‍යාපාරික / අධ්‍යක්ෂවරුන්ගේ)
x. අනෙකුත් අවශ්‍ය ලේඛන

**6.1.3 අවශ්‍ය ලේඛන (ඇපකරුවන්)**

i. ඇපකරු අයදුම් පත්‍රය සහ වත්කම් ප්‍රකාශ ප රමය
ii. ජාතික හැඳුනුම්පත් පිටපත
iii. ආදායම් ප්‍රකාශ (වැටුප් තහවුරු කිරීමේ ලිපිය / මෑත වැටුප් තොරතුරු / බැංකු ප්‍රකාශ)
iv. බිල් ඔප්පු
v. CRIB වාර්තාව
vi. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
vii. අනෙකුත් ආදායම් සාක්ෂි ලේඛන

**6.2 ඇපකරයට අදාළ ලියකියවිලි - චංචල වත්කම්**

- ලියාපදිංචි සහතිකයේ මූලිකාංශය
- වාහනයේ නිරපේක්ෂ හිමිකාරිත්වය
- තක්සේරු වාර්තාව
- විකුණුම් ඉන්වොයිස්
- අමතර යතුර

## 7 පොදු අවශ්‍යතා

- ව්‍යාපාරික ස්ථානයේ ඡායාරූප (නාම පුවරුව සමඟ) සහ ආරක්ෂාව
- පරීක්ෂා වාර්තාව
- ණය අවශ්‍යතාව සඳහා සාක්ෂි

## 8 ප්‍රධාන නියම සහ කොන්දේසි

i. ණය පහසුකම අයදුම්කරුවන්ට පෙර දැනුම් දීමකින් තොරව හ Merchant Bank of Sri Lanka & Finance PLC (MBSL) විසින් අවශ්‍යයි යැයි සලකා බැලෙන ඕනෑම වේලාවක, ඉල්ලීම මත ගෙවීමට බැඳී පවතී.
ii. අයදුම්කරුවන් විසින් වාහන මත හවුල් අයිතිවාසිකම්, බන්දුම්, හ වෙනත් යම් බැඳුමක් (encumbrance) නිර්මාණය නොකරන බවත්, එවැනි දෑ සිදු නොකළ යුතු බවත් අනුගමනය කිරීමට කැප විය යුතුය.
iii. MBSL වෙත අයදුම්කරුවන්ගේ ව්‍යාපාරයේ ගිණුම් පොත් පරීක්ෂා කිරීමේ අයිතිය හිමි වේ.
iv. MBSL නිලධාරීන්ට, අයකළ යුතු මුදල් ප්‍රතිසාධනය සඳහා, අයදුම්කරුවන්ගේ ව්‍යාපාර ස්ථානයට හ වාසස්ථානයට

පැමිණීමට බලය ඇත. එවැනි පැමිණීම් සඳහා වන වියදම් අයදුම්කරුවන් විසින් දරිය යුතුය.

v. MBSL විසින් වරින්වර තීරණය කරන පරිදි, ව්‍යාපාරය පරීක්ෂා කිරීම සඳහා අයදුම්කරුවන්ගේ සහ/හ ඇපකරුවන්ගේ ව්‍යාපාර ස්ථාන හ වාසස්ථාන වෙත ප්‍රවේශ වීමට MBSL හිටපු අයිතියක් ඇත. එවැනි පරීක්ෂණ, අයදුම්කරුවන්ට හ ඇපකරුවන්ට පෙර දැනුම් දීමට හ නොදැනුම් දීමට සිදු කළ හැක.

vi. මෙම පහසුකමට අදාල අනෙකුත් සියලු කොන්දේසි හා නියමයන් ඇතුළත් වන ලෙස, පාර්ශවයන් අතර ම ටර් වාහන ණය ගිවිසුමක් (Auto Loan Agreement) අත්සන් කරනු ලබන අතර, එය මෙම පිරිනැමීමේ ලිපියේ අංගයක් ලෙස සැලකේ.

vii. පිළිගත් රක්ෂණ සමාගමකින් සම්පූර්ණ රක්ෂණයක් (Comprehensive Insurance) ලබාගත යුතු අතර, එම MBSL වෙත පවරා තිබිය යුතුය. තවද, එම රක්ෂණය වාර්ෂිකව අලුත් කර MBSL වෙත භාරදිය යුතුය. ඉහත නියමයන්ට අනුකූල නොවන්නේ නම්, MBSL විසින් එම රක්ෂණය අලුත් කිරීමට අයිතිය රඳවා තබා ඇති අතර, එයට අදාළ වියදම් අයදුම්කරුවන්ගේ ණය ගිණුමට බැර කරනු ලැබේ.

viii. ඉහත සඳහන් වාහනයේ සම්පූර්ණ හිමිකරු ලෙස MBSL ලියාපදිංචි කරනු ලබන අතර, MBSL විසින් අවශ්‍යයි යැයි සලකා බලන අවස්ථාවලදී එම ලියාපදිංචි හිමිකම් MBSL වෙත මාරු කරනු ලැබේ. අයදුම්කරුවාට වාහනය භාවිතා කිරීමේ හිමිකම හිමි වුවද, MBSL ඉල්ලීම මත එම භාවිත හිමිකම MBSL වෙත ආපසු භාර දිය යුතුය. MBSL විසින් අවශ්‍ය යැයි සලකා බලන ඕනෑම කාලයකදී හා ස්ථානයකදී වාහනය භාවිතයෙන් ඉවතට ගැනීමටත්, තම අධිකාරිය අනුව එය විකිණීමට හ වෙනත් ආකාරයකින් අත්පත් කර ගැනීමේ අයිතිය ඇත.

## 9 අවසන් කිරීම සහ අයකර ගැනීම - නෛතික ක්‍රියාපටිපාටිය

මෙහි ඇතුළත් පූර්ව කොන්දේසි ප්‍රකාරව MBSL ආයතනය විසින් මෙම පහසුකම අවසන් කරනු ලබන අවස්ථාවක දී, අයදුම්කරු/ අයදුම්කරුවන් සහ/හ ඇපකරු/ ඇපකරුවන් වෙත එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමටත්, MBSL ආයතනය වෙත ගෙවිය යුතු හිඟ මුදල් සමඟ මුද්දර ගාස්තු, නීති ගාස්තු ඇතුළු නීතිමය කටයුතුවලදී දරන්නට වූ සියලුම පිරිවැය අයකර ගැනීම සඳහා ලබා දී ඇති ඇපකර අත්පත් කර ගැනීමට/විකිණීමට MBSL ආයතනයට හිමිකම ඇත.

## 10 අදාළ වන නෛතික විධිවිධාන

අ) 1946 අංක 06 දරන සංශ ධිත උකස් පනත

ආ) 1982 අංක 29 දරන පාරිභ ගික ණය පනත

ඇ) ගිවිසුම් නීතිය

ඈ) ශ්‍රී ලංකාවේ සිවිල් සහ අපරාධ නීතිය

ඉ) 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත

ඊ) 1998 අංක 21 දරන හිමිකම ලියාපදිංචි කිරීමේ පනත

උ) 1995 අංක 11 දරන බේරුම් කිරීමේ පනත

ඌ) 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත

එ) 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත

ඒ) 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනත

ඔ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත

ඕ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත

## 11 පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය

පාරිභ ගිකයන් හට අපගේ ණය පහසුකම හ සේවාවන් සම්බන්ධයෙන් වන පැමිණිලි පහත සඳහන් ඕනෑම ක්‍රමයක් මඟින් ඉදිරිපත් කළ හැකිය;

**අ)** ළඟම පිහිටි ශාඛාව වෙත පැමිණ ශාඛා කළමනාකරු වෙත පැමිණිල්ල ඉදිරිපත් කිරීම.

**ආ)** අපගේ පාරිභ ගික සේවා ක්ෂණික ඇමතුම් අංක 011 - 4 711 711 ඇමතීම මඟින් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම හ

info@mbslbank.com / customercare@mbslbank.com යන විද්‍යුත් තැපැල් ලිපින හරහා දැනුම් දීම.

ඇ) තැපැල් මඟින් - පහත ලිපිනය වෙත ලිඛිතව පැමිණිල්ල යොමු කිරීම;

**පැමිණිලි හැසිරවීමේ නිලධාරී (වැඩබලන),**
**මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,**
**අංක 28, ලංකා බැංකු මර්චන්ට් කුළුණ,**
**ශාන්ත මයිකල් පාර,**
**කොළඹ 03.**